1980 - 3 - 5

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1980 අංක 54 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 දෙසැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1980 අංක 54 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 76/80

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 54 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1979 අංක 24 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ 1 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, ඒ අලුත් වගන්තිය එහි 1අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන පනතෙහි 1අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, මේ පනතට යටත්ව කියවිය යුතු බව. 1අ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, ඇප සම්බන්ධයෙන් වූ සියලු කාරණාවල දී මේ පනතේ විධිවිධානවලට යටත්ව කියවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (අ) ඡේදයෙහි පළමු වන අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද ඒ අධිකරණය මහාධිකරණය නම්, ඒ මහාධිකරණයට ද ඒ අධිකරණය මහෙස්ත්‍රාත් අධිකරණයක් නම් ඒ මහෙස්ත්‍රාත් අධිකරණයේ කොට්ඨාසය පිහිටා ඇත්තේ යම් කලාපයක් ඇතුළත ද, ඒ කලාපයේ පවත්වාගෙන යනු ලබන මහාධිකරණයට ද—

(i) වරද දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන වගන්තිය හෝ 191 වන වගන්තිය හෝ 296 වන වගන්තිය හෝ යටතේ වූ වරදක් නම් නීතිපතිවරයාගේ කැමැත්ත ඇතිව ඒ තැනැත්තා ඇප පිට නිදහස් කිරීමට ; හෝ

(ii) 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වන විට හැර, වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් නම්, අසාමාන්‍ය අවස්ථාවල දී ඒ තැනැත්තා ඇප පිට නිදහස් කිරීම සඳහා අධිකරණයේ හේතු වාර්තාගත කිරීමෙන් පසු ඒ තැනැත්තා ඇප පිට නිදහස් කිරීමට

නියි බලය තිබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 2අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

ඒ 52151—9,400 (61/02)

"2(අ) වගන්තියෙහි සඳහන් තැනැත්තන්ට අසාමාන්‍ය අවස්ථාවල දී හැර අභියාචනාධිකරණය විසින් ඇප නොදිය යුතු බව.

2අ. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද 2 වන වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් තැනැත්තකුට අසාමාන්‍ය අවස්ථාවල දී හැර අභියාචනාධිකරණය විසින් ඇප නොදිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4 වන වගන්තියේ (අ) ඡේදයෙහි "යම් වරදකට යම් තැනැත්තකු වරදකරු කරන සෑම අධිකරණයක් ම" යන වචනවලට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සිදු කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් ඇතුළත සිදු කරන ලද මෙහි පළමුවන හෝ දෙවන උපලේඛනවල දක්වා ඇති යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා කලින් වරදකරු කරනු ලැබ ඇත් නම්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තියේ "1980 දෙසැම්බර් මස තිස්එක වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1982 දෙසැම්බර් මස තිස්එක වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 7 වන විෂයයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

'7අ. දණ්ඩ නීති සංග්‍රහයේ 300 වන වගන්තිය.

පාවිච්චි කරනු ලැබ ඇති ආයුධය, 1966 අංක 18 දරන පිඩාකාරි ආයුධ පනතෙහි අර්ථ කථනය කොට ඇති පරිදි "පීඩාකාරී ආයුධයක්" හෝ පුපුරන ද්‍රව්‍ය පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි "පුපුරන ද්‍රව්‍යයක්" හෝ තුවක්කු ආඥා පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි "තුවක්කුවක්" හෝ වන අවස්ථාවක, මිනී මැරීමට තැත් කිරීම.';

(2) එහි 8 වන විෂයයෙහි "වරදෙහි ස්වභාවය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "මහා මාර්ගයේ දී කරනු ලබන කොල්ලකෑම" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති දේපළ මහා මාර්ගයේ දී කොල්ලකෑම" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 8 වන විෂයයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

"8අ. දණ්ඩ නීති සංග්‍රහයේ 382 වන වගන්තිය. තොල්ලකෑම සිදු කිරීමේදී, ස්වේච්ඡාවෙන් පීඩා සිදු කිරීම.";

(4) එහි 17 වන විෂයයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

"17අ. තුවක්කු ආඥාපනතේ 17 වන වගන්තිය. බලපත්‍රයක් නොමැතිව තුවක්කු නිෂ්පාදනය කිරීම."; සහ

(5) එහි 18 වන විෂයයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් :—

"19. පුපුරන ද්‍රව්‍ය පනතේ 8 වන වගන්තිය. බලපත්‍රයක් නොමැතිව පුපුරන ද්‍රව්‍ය ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම ආදිය.

20. පුපුරන ද්‍රව්‍ය පනතේ 9 වන වගන්තිය. බලපත්‍රයක් නොමැතිව පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයකු, ආනයනකරුවකු යනාදී වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි 2 වන විෂයයෙහි "වරදෙහි ස්වභාවය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "මිනී මැරීමට තැත් කිරීම" යන වචන වෙනුවට 'පාවිච්චි කරනු ලැබ ඇති ආයුධය, 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි "පීඩාකාරී ආයුධයක්" හෝ පුපුරන ද්‍රව්‍ය පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි "පුපුරන ද්‍රව්‍යයක්" හෝ තුවක්කු ආඥාපනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි "තුවක්කුවක්" හෝ නොවන වෙනත් ආයුධයක් වන අවස්ථාවක මිනී මැරීමට තැත් කිරීම' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එහි 5 වන විෂයයෙහි "වරදෙහි ස්වභාවය" යන ශීර්ෂය යටතේ "මහාමාර්ගයේ දී කරනු ලබන තොල්ලකෑමක් නොවන තොල්ලකෑමක්" යන වචන වෙනුවට "කොල්ල කන ලද දේපළවල වටිනාකම රුපියල් පස් දහසකට අඩු වන අවස්ථාවක, මහා මාර්ගයේ දී කරනු ලබන කොල්ලකෑමක් නොවන කොල්ලකෑමක්." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එහි 7 වන විෂයය අත්හැරීමෙන්.

9. මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන මේ පනත ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි, අභියාචනයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ යම් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා සියලු අපරාධ නඩු, නඩු කටයුතු හෝ වෙනත් කාරණා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. විනිශ්චයට භාජනව පවත්නා නඩු